**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1012/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 16/06/2024<br>පැය1040 |

# මාධ්‍ය නිවේදනය

## පොලිස් නිලධාරින් බවට පවසා මුදල් හා දේපල කොල්ලකෑ සැකකරුවෙකු අත්අඩංගුවට - මරදාන පොලිස් ස්ථානය.

2024.06.14 වන දින මධ්‍යම රාත්‍රියේදී මරදාන පොලිස් වසමේ කැටවලමුල්ල හන්දිය ආසන්නයේදී යතුරු පැදියකින් පැමිණි පුද්ගලයින් දෙදෙනෙකු ඔවුන් පොලිස් නිලධාරින් බවට පවසමින් මාර්ගයේ ගමන් කරමින් සිටි පුද්ගලයෙකු පරීක්ෂාකර එම පුද්ගලයාට පහරදී, ඔහු සතුව තිබූ රුපියල් ලක්ෂ දෙකකට ආසන්න වටිනාකමින් යුතු ජංගම දුරකථනයක් හා මුදල් පසුම්බිය කොල්ලකා ඇති අතර එම දේපල අවශ්‍ය නම් රුපියල් 35000/= ක් රැගෙන මරදාන පොලිස් ස්ථානයට පැමිණෙන ලෙස පවසා පලා යාමේ සිද්ධියක් සම්බන්ධව ලද පැමිණිල්ලකට අනුව විමර්ශන ආරම්භ කර තිබුණි.

මේ අතර 2024.06.15 වන දින මරදාන පොලිස් ස්ථානයේ නිලධාරින් කණ්ඩායමකට හෙරොයින් මත් ද්‍රව්‍ය රැගෙන පුද්ගලයෙකු යතුරු පැදියකින් පැමිණෙන බවට ලද තොරතුරකට අනුව මරදාන ෆොන්සේකා මාවත හන්දියේදී මාර්ග බාධකයක් යොදා අදාල යතුරු පැදිය නවතා යතුරු පැදිකරු පරීක්ෂා කිරීමේදී ඔහු සන්තකයේ තිබී හෙරොයින් ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 120 ක් තිබී සොයාගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන මරදාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අත්අඩංගුවට ගත් සැකකරු සම්බන්ධ වැඩිදුර විමර්ශනයේදී සැකකරු පැමිණි යතුරු පැදිය ඉහත කොල්ලකෑම සඳහා යොදාගත් යතුරු පැදිය බවට අනාවරණ වී ඇත. ඒ අනුව සැකකරුගෙන් සිදුකල ප්‍රශ්න කිරීමේදී කොල්ලකන ලද ජංගම දුරකථනය සැකකරුගේ නිවසේ සඟවා තිබියදී පොලිසිය විසින් සොයාගෙන ඇති අතර අනෙක් සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා මරදාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.
සිවිල් ඇඳුමින් සැරසී පොලිස් නිලධාරින් බවට පවසමින් පුද්ගලයින් හෝ දේපල පරීක්ෂාවක් සිදුකරන අවස්ථාවලදී ඔවුන්ගේ නිල හැඳුනුම්පත මඟින් අනන්‍යතාවය

තහවුරු කරගැනීමට මහජනතාවට අයිතියක් ඇති අතර එමඟින් මෙවැනි අපරාධ වළක්වාගැනීමට හැකියාව ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**